Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදනය
**21 සැප්තැම්බර් 2020, කොළඹදී**

# වඩාත් ඔරොත්තු දෙන පොල් වගාකිරීම සඳහා පොල් ගොවීන් 3,000කට පොල් වගා මණ්ඩලය හා නෙස්ලේ වෙතින් පුහුණු හා කෘෂිකාර්මික සහාය ලැබෙයි

## නෙස්ලේ පොල් වගා සැලසුමට වසර හතරයි

නෙස්ලේ පොල් වගා සැලසුමට වසර හතරක් පිරීම නිමිත්තෙන් පසුගියදා සංවිධානය කළ විශේෂ උත්සවයකදී, එම සැලසුමේ පොල් ගොවීන් හා වගාකරුවන් 3,000කට පොල් වගා මණ්ඩලය හා නෙස්ලේ වෙතින් පොහොර කිලෝග්‍රෑම් 150,000ක් හා නවීන වගා ක්‍රමවේද හිමිවුණි.

පසුගිය වසර කිහිපය පුරා නියගය සහ වගාවට වැළඳුණු රෝග හේතුවෙන් මෙරට පොල් සැපයුම විශාල පසුබෑමකට ලක්විය. එවන් පසුබිමක නෙස්ලේ පොල් වගා සැලසුම හරහා, රෝග ආසාදනවලට හොඳින් ඔරොත්තු දෙන පොල් වර්ග වගා කිරීමට අවශ්‍ය සහාය මෙන්ම, පොල් වගාව ආශ්‍රිත නව තාක්ෂණය, යහපත් ක්‍රමවේද, ගුණාත්මක වගා අමුද්‍රව්‍ය සහ වෘත්තිමය කෘෂි ආර්ථික සහාය ද පොල් වගාකරන්නන්ට හිමිවී ඇත.

"පොල් කියන්නේ ශ්‍රී ලාංකික ජන ජීවිතය හා බද්ධ වුණු අපගේ වැදගත් ම වැවිලි බෝගයක්. පොල් වගා සැලසුමට වසර හතරක් සම්පූර්ණ වන මේ අවස්ථාවේදී ඒ හරහා උදාවුණු ධනාත්මක බලපෑම මම සිහිපත් කරන්නේ මහත් සතුටින්. මේ යටතේ අපි බෙදාදුන් පොල් පැළ 95%ක ඉහළ සාර්ථකත්වයක් වාර්තා කර ඇති අතර, එම පැළ හොඳින් වර්ධනය වෙලා තිබෙනවා. මෙම සාර්ථකත්වය, පොල් වගා මණ්ඩලය හා නෙස්ලේ අතර දියත් වුණු රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවයේ ශක්තියට කදිම සාක්ෂියක්" යනුවෙන් පොල් වගා මණ්ඩලයේ සභාපති ජයන්ත වික්‍රමසිංහ මහතා පැවසීය.

2016 වසරේදී ආරම්භ වූ නෙස්ලේ පොල් වගා සැලසුම හරහා පොල් ගොවි පවුල් 3,000කට, අයහපත් කාලගුණික තත්ත්ව මෙන්ම වගාවට වැළඳෙන රෝග ආසාදනවලට ඔරොත්තු දෙන විශේෂ දෙමුහුන් පොල් පැළ 19,000ක් ලබා දී ඇත. එහි පළමු කාණ්ඩය 2021 වසරේදී පරිණත වීමට නියමිත ය. පොල් සැපයුම වර්ධනය කිරීමට මෙම නෙස්ලේ පොල් සැලසුම හරහා පොල් වගාකරන්නන්ට තම ගෙවතුවල හා සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයෙන් පිටත ප්‍රදේශවල පොල් වගාකිරීමට ද දිරිය සැපයේ. තව ද පොල් වගා සැලසුම හා එක්වන්නන් පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණින් ආදර්ශ පොල් ගොවිපොළවල් හතරක් ද පවත්වාගෙන යනු ලබයි. පොල් වගාවන්ට ජල සම්පාදනය කිරීම බොහෝ පොල් වගාකරුවන් මුහුණ දෙන ගැටලුවකි. ඊට විසඳුමක් ලෙස නල ළිං සහ ක්ෂුද්‍ර වාරි පද්ධතියක් මගින් සාර්ථක ජල සම්පාදනයක්

සිදුකරන අයුරු, ආදර්ශ ගොවිපොළවල් දෙකක් හරහා පෙන්නුම් කෙරේ. මීට අමතරව පොල් පැළ පරිණත වනතුරු අතිරේක ආදායමක් ලැබීම සඳහා කෙටි කාලීන එලවළු වැනි අතුරු බෝග වගාකිරීමට ද ගොවි මහතුන් දිරිමත් කෙරේ.

"දේශීය පොල් කර්මාන්තයට සහාය දැක්වීම වසර 35කට ආසන්න කාලයක් පුරාවට අපේ හදවතට සමීප වූ දෙයක්. මැගී පිටිකළ පොල් කිරි නිෂ්පාදනය වෙනුවෙන් උසස්ම තත්ත්වයේ දේශීය පොල් ගෙඩි සපයා ගනිමින්, වර්තමානයේදී 6,000කට වැඩි ශ්‍රී ලාංකික පොල් ගොවි පවුල් ප්‍රමාණයක ජීවනෝපාය සඳහා අපි දායක වෙනවා. දේශීය පොල් කර්මාන්තයට අනුග්‍රහය දැක්වීමේ අපගේ නවතම වැඩසටහන ලෙස හැඳින්විය හැකි නෙස්ලේ පොල් වගා සැලසුම හරහා තවත් පොල් වගාකරන පවුල් 3,000කට අපි සහාය වෙනවා. ඉක්මණින් පරිණත වන සහ විවිධ කාලගුණ තත්ත්වයන්ට හා රෝග වලට ඔරොත්තු දෙන විශේෂ දෙමුහුන් පැළ වර්ග හඳුන්වා දීම මගින් වැඩි දෙනෙක්ට පොල් වගාකිරීමටත් ඒ හරහා පොල් සැපයුම වැඩිකිරීමට හැකිවන බවටත් අපට විශ්වාසයි. 'යහපත් ආහාර, යහපත් ජීවිතයක්' ලබා දෙන (Good food, Good life) සමාගමක් ලෙස මෙය අපේ අරමුණෙහි කොටසක්. එනම් පාරිභෝගිකයන්ට පමණක් නොව ඔවුන්ගේ ප්‍රජාවට ම නෙස්ලේ නිෂ්පාදන තුළින් යහපතක් ඇතිවන බව ගැන අපගේ පාරිභෝගිකයන් දැනුවත් කළ යුතුයි." යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවලින් මහතා පැවසීය.